# 26

# ආදම් (අලයි) තුමා

ලොව පළමු මිනිසා ආදම් (අලයි) තුමා ය. එතුමා අබුල් බෂර් කියා ද හඳුන්වනු ලබයි.

අල්ලාහ් ආදම් (අලයි) තුමා මැව්වේ පසෙනි. ඒ සඳහා පොළවේ සියලු ප්‍රදේශවලින් ම පස් ලබා ගන්නා ලදි. එම නිසා පසේ පාට හා ස්වභාවය අනුව සමහරු සුදු පාට ද තවත් සමහරු කළු පාට ද තවත් සමහරු රතුපාට ද අනෙක් අය අතර මැද පාටින් ද දක්නට ලැබති. මිනිසුන්ගෙන් සමහරුන් මෘදු අය ද තවත් සමහරු ගොරහැඩි අය ද  අනෙක් අය අතරමැදි ස්වභාවයෙන් යුක්ත වීමට හේතුව ද එය ම වන්නේ යැයි හදීස් අහමද් හි සඳහන් වන්නේ ය.

අල්ලාහ් ආදම් (අලයි) තුමා මැවීමට පෙර මැලක් වරුන් ආලෝකයෙන් ද ජින් වරුන් ගින්නෙන් ද මැව්වේ ය. ආදම් (අලයි) මැවීමට කලින් ම  පොළොවේ තම නියෝජිතයා මවන්නට යන බව මැලක්වරුන්ට අල්ලාහ් දැන් වූයේ ය.

"පොළව මත කලබල ඇති කර ලේ හලන අය ඇයි ඔබ මවන්නේ ?"යැයි මැලක්වරු තම විමතිය පළ කළහ. එයට "ඔබ නොදන්නා දේ මම දනිමි" යි මැලක් වරුන්ට පිළිතුරු දුන්  අල්ලාහ්  මිනිස් වර්ගයාගේ පියා වූ  ආදම් (අලයි) මැව්වේ ය.

අල්ලාහ් ආදම් (අලයි) තුමාට සියලු මැවුම්වල නම් ඉගැන්වූයේ ය. පසුව, මැලක්වරුන් කැඳවූයේ ය. එම මැවුම්වල නම් කියන ලෙස කීය. ඔවුහු " අපි ඔබ පාරිශුද්ධ කළෙමු. ඔබ උගැන්වූ දේ හැර අන් කිසිවක්  අපි නොදනිමු" යැයි පිළිතුරු දුන්හ. පසුව අල්ලාහ්ගේ අණ පරිදි ආදම් (අලයි) තුමා එම මැවුම් වල නම් කීවේ ය.

එයිනික්බිති මැලක්වරුන් අමතා ආදම් (අලයි) ට සුජූද් කරන ලෙස අණ කළේ ය. එහෙත් එහි සිටි ජින් වර්ගයට අයත් ඉබ්ලීස් සුජූද් කිරීම ප්‍රතික්ෂේප කළේ ය.

"මම ආදම්ට වඩා ශ්‍රේෂ්ඨ ය. ආදම් පසෙන් මවනු ලැබුවෙකි. මම ගින්නෙන් මවනු ලැබූ අයෙකි" යැයි හේතු දක්වා ඔහු තම ක්‍රියාව සාධාරණීකරනය කළේ ය. අල්ලාහ් ගේ අණට කීකරු නොවූ නිසා ඔහු අල්ලාහ්ගේ සාපයට ලක් වූයේ ය.

ඉබ්ලීස් තමා සාපයට පත්වීමට හේතු වූ ආදම් අලයි (තුමා) නොමග යැවීමට අධිෂ්ඨාන කරගත්තේ ය.

ආදම් (අලයි) තුමා, තම බිරිඳ හව්වා (අලයි) සමග ස්වර්ගයේ ජීවත් විය. එහි දී ස්වර්ගයේ සැප සම්පත් විඳීමට අවසර ලැබ තිබුණා. ඒත් එක්තරා ගසක් ළඟට යෑම තහනම් කරනු ලැබුවා. ඉබ්ලීස් මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගන්නට හිතුවා. එම ගසේ ගෙඩි කෑවා නම් ස්වර්ගයේ හැමදාම ජීවත් විය හැකි යැයි ඔවුන් පොළඹන්න වුණා. ඔහුගේ එම චාටු බසට රැවටුණු ඔවුන් දෙන්නා සත්‍යය අමතක කර එම ගසේ ගෙඩි කන්නට වූණා. ඒ නිසා අල්ලාහ්ගේ දැඩි උදහසට ලක් වුණා.

අල්ලාහ් ඒ දෙදෙනා මෙලොවට පහළ කළා. දෙමහල්ලන් දෙදෙනා දෙ දිශාවකට යවනු ලැබුවා. ඔවුන් දෙදෙනා තමන්ගේ වරද ගැන සිතමින් පසුතැවිලි වෙමින් දීර්ඝ කාලයක් තිස්සේ අඬන්න වුණා. තමනට සමාව දෙන ලෙස ඇයදිමින් පසු වුණා.

"අපගේ හිමියාණෙනි, අප කළ දේ අපට ම හානිකර වුණා. ඔබ අපට සමාව නො දුන්නේ නම් අනිවාර්යයෙන් ම අපි අභාග්‍යවන්තයෝ වන්නෙමු" (7:23) යැයි ප්‍රාර්ථනා කළෝ ය.

අල්ලාහ් ඔවුනට සමාව දුන්නේ ය. දෙදෙනා ම එක් ස්ථානයක මුණ ගැසෙන්න සැලැස්වූයේ ය. ඔවුහු පවුලක් ලෙස ජීවත් වූහ. ඔවුන්ට ජීවත් වීමට අවශ්‍ය පහ සුකම් අල්ලාහ් ඇති කර දුන්නේ ය.

ඔවුන්ගෙන් මිනිස් වර්ගයා බෝ විය. පිරිමි හා ගැහැනු වශයෙන් නිවුන් දරුවන් ලදහ. අද ලොව ජීවත්වන්නේ ඔවුන්ගෙන් ලද පරපුර ය.

ඉරු උදා වන දවස් අතුරින් උතුම් ම දවස සිකුරාදා දවස වන්නේ ය. ආදම් (අලයි) තුමා මවනු ලැබුවේ එම දවසේ ය. ඔවුන් ස්වර්ගයේ නවත්වනු ලැබූවේ ද ඔවුන් ස්වර්ගයෙන් පිටමං කරනු ලැබූවේ ද එම දවසේ ය. ඔවුන් අභාවප්‍රාප්ත වූයේ ද එම දවසේ ය. (මුස්ලිම්) යැයි නබි (සල්) තුමා වදාරා ඇත.

එතුමාගේ අභාවයෙන් පසුව එතුමාගේ පුත් ෂීදු (අලයි) නබිත්වයට පත් විය. මිනිසුනට යහමග පෙන් විය. එතුමන්ට සුහ්ෆු ලබා දෙන ලදි.

**අභ්‍යාසය**

1. කෙටි පිළිතුරු සපයන්න

(අ) ආදම් (අලයි) මවනු ලැබුවේ කුමකින් ද?

(ආ) එතුමාගේ බිරිඳගේ නම කුමක් ද?

(ඇ) එතුමා වෆාත් වු දවස කවදා ද ?

2. ආදම් (අලයි) තුමා (මිනිස් වර්ගයා) ගැන මැලක්වරු කී අදහස සඳහන් කරන්න

3. ඉබ්ලීස් ආදම් (අලයි) තුමාට සුජූදු කිරීමට ප්‍රතික්ෂේප කළේ ඇයි?

4. ආදම් (අලයි) තුමා සහ සිකුරාදා දවස අතර සම්බන්ධය කුමක් ද?

5. මිනිසා හා ජින් අතර පවතින වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.